# Repair bhavana

My immense gratitude to the great Noble council of Akanitta brahma realm

10/09/2021




## Lightning sign for repairing

කය repair කරන පථය රතු රේඛා වලින් දැක්වේ.

පරිදේව වූ සංස්කාර මගින් සංඥාව සුබ යැයි පවසනවා. සංස්කාර පරිදේව වන්නේ නම් කෙසේ සංඥාව සුබ වන්නේද? අසනීප සෑදී ඇත. ආකිඤ්චඤ්ඤායතන වැනි තලයන්ගෙන් මැරී වැටී ඇත්තේය. සංඥාව සුබ යන්න මුසාවකි. සුභයට නිත්‍ය එකතුකර සුබ යැයි කීවේය. යථා පුරෙ තථා පච්ඡා යන සංඥාව නසන ලද්දේය. කුමක් නිසාද? පෙර සුභ පසුව සුබ යැයි කීම නිසාය. පෙර මෙන්ම පසු නොවේ. මෙහි විඤ්ඤාණ ස්ථිතියක් නොවිය යුතුය. මෝහය දක්වා පැමිණි සුබ යන අර්ථය, එහි උග්‍රවන්නේ, තීව්‍ර වන්නේ, සංස්කාරයන් මගින් උදව් කරන්නේ (support) මෝහයම වැඩිවේ. යථා පච්ඡා තථා පුරෙ -පසු (වැඩිවූ මෝහය) යම්සේ නම් පෙරත් (ඉහත A- නිත්‍ය සංඥාව ) එසේය යන සංඥාව වනසයි. කාමරාග අනුසය හරහා සංඥාව සුබ යැයි පවසනවා.

මෝහ ගලේ වැදී කුඩුවී පැමිණ ඇති නිසා නාම රූප ලකුණු කර ඇති තැනදී, පතිලීයති -shrinking away - වකුටුවේ, සිත නොඇලෙයි යන්න සිදුවිය යුතු නමුත් එසේ නොවී, චේතනා කර අත්තා කර ගන්නේ අත්තානු දිට්ඨියේ බලපෑම නිසාය. විඤ්ඤාණ ප්‍රත්‍යය යෙන් වන නාම රූප යන රැල්ල විශාල නිසා එම දහරාවට අසුවී සුබය තමා (අත්තා) කර ගෙන ශෝකයට පත්වුයේය. මෙහිදී දිට්ඨී දෙක සමාන නැති බවත්, සංකල්ප දෙක සමාන නැති බවත්, සංස්කාර දෙක සමාන නැති බවත් දැන ගනී. 4 -3 වේදනා ජරා, 4-6 වේදනාවේ ව්‍යාධිය ඇතිවී ඇත. තව ඉදිරියට ගියහොත්, 5-3 සංඥාවේ ජරා, 5-4 වේදනාවේ මරණය- දෝමනස්ස ඇතිවේ. මේ නිසා පතිකුටති- හැකිලෙයි- bends away, පසු බැමක් විය යුතු නමුත් සංස්කාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණයෙන් දැන රූපය කරා දිට්ඨී අනුසය පාරේ ගමන් කර රූපයට සුබ යැයි පවසයි. මෙම ගමනේදි, ස්පර්ශය ලඟදි පතිවත්තති -අහක්වෙයි - pulls back, rolls away යන්න සිදුවිය යුතු නමුත් එය එසේ නොවෙයි. සංඥාව සුබ යන ආදියෙන් මත් වී ඇත්තේය. එසේ වන්නේ, ඵස්සපරෙතානං- ස්පර්ශයෙන් මැඩීගිය ස්වභාවය ඇතිවේ. මෙහිදී

තෙසං ඵස්සපරෙතානං භවසොතානුසාරිනං,

කුම්මග්ගපටිපන්නානං ආරා සංයොජනක්ඛයො.

ස්පර්ශයෙන් මැඩීගිය, භවස්‍රෝතස (තෘෂ්ණාව) අනුව යන සුලු කුමගට පිළිපන් ඔවුනට සංයෝජනයක්‍ෂය දුර (away) වේ.

යන ගාථාව සිහි කළ යුතුය. මෙසේ කුමගට පිළිපන් ඔවුහු රූපයට සුබ යැයි පවසයි. රූපයක සුබයක් කොයින්ද සුභයක්වත් නැතිකොට? විඤ්ඤාණය නොමග යවන ලදී.

I. පිරිසිදු විඤ්ඤාණය , අහෝ ජිවිත ඉන්ද්‍රිය.

II. මෙහිදී ජිවිත ඉන්ද්‍රියේ ඇති අසරණ ස්වභාවය මෙනෙහි කළ යුතුයි. සංස්කාර පරිදේව වන්නේ නම්, නිත්‍ය දිට්ඨි, පදුට්ඨමනසඞ්කප්ප අගයෝ මගින් ජිවිත ඉන්ද්‍රියේ පැවැත්මක් නැත.

III. පරාමාසකායගන්ථය තුළ දුක ඇත.

IV. ශෝකය තුළ මිසදිටු බව ඇත.

V. ජරාව දුකය.




1. අපි ජාතියේ සිට මිච්ඡා දිට්ඨී වූයේ නම් ජරාව වේ. මෙයින් නාමකායේ පටිඝ සම්ඵස්ස අගය සෑදෙයි. "පෙර මෝහය, ද්වේශ සහිතව ජීවත්වීම- ආකාසානඤ්චායතන සංඥාව මගේ යැයි ගැනීම, පාණාතිපාතය- හතරවෙනි ධ්‍යානය මරාගෙන පස්වෙනි ධ්‍යානයට යෑම" යන්න සිහි වේ.
2. අපි ජාතියේ සිට අභිජ්ඣා වූයේ නම් දුකය. අභිජ්ඣාවෙන් පටිඝානුසය ඇති වන්නේ නැවතත් නාමකායේ පටිඝ සම්ඵස්ස අගය සෑදෙයි.
3. අපි ජාතියේ සිට ව්‍යාපාද වූයේ දෝමනස්සය හට ගනී. එසේ නම් පටිඝානුසය ඇත්තේ නැවතත් නාමකායේ පටිඝ සම්ඵස්ස අගය සෑදෙයි.

තණ්හාවෙන් ජරා, දුක්ඛ, දෝමනස්ස යන තුන් අගයන් එකතු කරන්නේය. දුක එකතු කරන්නේ දුකම ඇතිවේ.

මෙසේ වටහා ගන්නේ නම් ජරාව ළඟදී - න සම්පසාරියති- දිග නොහැරේ - not drawn in, ඇතුලට නොඇදේ යන්න සිදුවිය යුතුය.
එනමුදු, භවස්‍රෝතස (තෘෂ්ණාව) - stream of existence ඇත්තේ
ජරා -> ගිද්ධිලෝභ -> රූප යන්න සිදුවේ.
මෙසේ මනා වැටහීම් ඇත්තේ ඉද්ධි බල පවතී. පිරිසිදු විඥ්ඥාණය, රූපය ජරාවී ඇත. එය repair කරන්න යැයි අණකර පවසයි.

සාදු උතුම් බුදු පියවරුනි